# පොලිස් මාධ්‍ය කොට්ඨාසය

## பொலிஸ் ஊடகப் பிரிவு

## POLICE MEDIA DIVISION

14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.11.27 පැය 1830 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 155 /2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**බීමත්ව රිය පදවා අනතුරු සිදුකල පොලිස් නිලධාරියෙකු අත්අඩංගුවට - වරකාපොල පොලිස් ස්ථානය.**

2025.01.26 දින කෑගල්ල පොලිස් ස්ථානයට අනුයුක්ත උප පොලිස් පරික්ෂකවරයකු විසින් පොලිස් කැබ් රථයක් ධාවනය කරමින් රිය අනතුරු දෙකක් සිදුකර ඉන් එක් පුද්ගලයෙකුට තුවාල සිදු කර රථය නොනවත්වා ධාවනය කරමින් සිටියදී වරකාපොල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ඔහුව අත්අඩංගුවට ගෙන පරික්ෂා කිරීමේදී එම උප පොලිස් පරික්ෂකවරයා බීමතින් සිට ඇති බවට අනාවරණය වී ඇත.

මෙම උප පොලිස් පරික්ෂකවරයා 2025.01.27 වන අද දින ගරු අධිකරණයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඔහු 2025.02.10 වන දින දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට ගරු අධිකරණය විසින් නියෝග කරන ලද අතර සබරගමුව පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති තුමාගේ උපදෙස් අනුව මෙම උප පොලිස් පරික්ෂකවරයාගේ වැඩ තහනම් කිරීමටද කටයුතු කර ඇත.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**